# ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම - රිදියගම ව්‍යාපාරය

දිනය - 2017/10/10

වේලාව - පෙ.ව. 9.00

ස්ථානය - නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලීය රැස්වීම් ශාලාව

2 0 NOV 2017
6980
M01

## සහභාගි වූ රජයේ නිලධාරීන්

### වාරිමාර්ග කළමනාකරණ අංශය

01. කේ.කේ. ඉන්ද්‍රානි මිය - නේවාසික ව්‍යාපෘති කළමනාකරු - රිදියගම ව්‍යාපාරය
02. පී.ඩබ්.ඒ.එල්.ඩී.ලක්මාලි මෙය - සංවර්ධන නිලධාරි - රිදියගම ව්‍යාපාරය
03. ඩබ්.එම්.නදීෂා ලක්මාලි මිය - සංවර්ධන නිලධාරි - රිදියගම ව්‍යාපාරය
04. එච්.කේ.ටී දිල්මන්ති මිය - සංවර්ධන නිලධාරි - රිදියගම ව්‍යාපාරය
05. ඒ.කේ නිලුකා ප්‍රියදර්ශනි මිය - සංවර්ධන නිලධාරි - රිදියගම ව්‍යාපාරය

### වාරිමාර්ග දෙපාර්තමේන්තුව

06. ඩබ්.එල්.එන් බුද්ධික මයා - ප්‍රා:වාරි:ඉංජිනේරු - ප්‍රා.වාරිමාර්ග ඉංජි. කාර්යාලය - අ/තොට
07. ඩබ්.සී රත්නකුමාර මයා - සංවර්ධන නිලධාරි - ප්‍රා. වාරිමාර්ග ඉංජි. කාර්යාලය - අ/තොට

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

08. එන්.පී.ඒ ගුණවර්ධන මයා - ස්ථානභාර කෘෂිකර්ම උපදේශක - අ/තොට

### ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

09. ඒ.ඩී ක්‍රිශාන්ති මිය - ගොවිජන සේවා සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි - අ/තොට

### ගොවි නියෝජිතවරු

01. කේ.පී.ඩී.ඊ ජයසේකර මයා - සභාපති සරුකෙත ගොවි සංවිධානය
02. ජේ.ඒ ප්‍රේමචන්ද්‍ර මයා - සභාපති - සමගි ගොවි සංවිධානය
03. ධනපාල සෙනවිරත්න මයා - භාණ්ඩාගාරික - සමගි ගොවි සංවිධානය
04. එම්.පී උපුල් ප්‍රියංග මයා - ලේකම් - ගජබා ගොවි සංවිධානය
05. ඕ.එම් ඥානතිස්ස මයා - සභාපති - ගජබා ගොවි සංවිධානය
06. ආර්.පී ඥානපාල මයා - ලේකම් - ගාමිණී ගොවි සංවිධානය
07. ඩබ්.පී ගුණපාල මයා - සභාපති - ගාමිණී ගොවි සංවිධානය
08. ඉන්ද්‍රා පතිරණ මිය - භාණ්ඩාගාරික - පුබුදු ගොවි සංවිධානය
09. ඒ.පී සැමී මයා - ලේකම් - වීර ගොවි සංවිධානය
10. හැන්ඩි අබේධීර මයා - ලේකම් - එකමුතු ගොවි සංවිධානය
11. යූ.ඩබ් දිසානායක මයා - ලේකම් - මහසෙන් ගොවි සංවිධානය

12. එච්.ඩබ් පද්මලතා මිය - සභාපති - එකමුතු ගොවි සංවිධානය
13. පී. ජී ගුණරත්න මයා - භාණ්ඩාගාරික - මහසෙන් ගොවි සංවිධානය
14. ප්‍රසාද් විජේරත්න මයා - සභාපති - කාවන්තිස්ස ගොවි සංවිධානය
15. එම්.එම් පියදාස මයා - භාණ්ඩාගාරික - සුභද්‍ර ගොවි සංවිධානය
16. ඩී.ඒ කරුණාදාස මයා - සභාපති - ප්‍රගති ගොවි සංවිධානය
17. යූ.ඒ රණසිංහ මයා - ලේකම් - කාවන්තිස්ස ගොවි සංවිධානය
18. ඩබ්.ඒ ජිනදාස මයා - සභාපති - පුබුදු ගොවි සංවිධානය
19. එල්.පී.ඩී සුමතිපාල මයා - භාණ්ඩාගාරික - ඉසුරු ගොවි සංවිධානය
20. ඒ.පී විමලදාස මයා - ලේකම් - ප්‍රගති ගොවි සංවිධානය
21. ඒ.ජේ.රංජිත් මයා - ලේකම් - විජය ගොවි සංවිධානය
22. ඩබ්.එච්.ධන්කන් මයා - සභාපති - රුහුණු ගොවි සංවිධානය
23. ඒ .පී ජිනදාස මයා - භාණ්ඩාගාරික - රුහුණු ගොවි සංවිධානය
24. පී. විජේසූරිය මයා - ලේකම් - රුහුණු ගොවි සංවිධානය
25. ජේ.ඒ.පී.එස් ශාන්ත මයා - භාණ්ඩාගාරික - පැරකුම් ගොවි සංවිධානය
26. ටී.එච් සිහාබ්දීන් මයා - සභාපති-අල්අක්බර් ගොවි සංවිධානය
27. ජේමසිරි කුලතුංග මයා - සභාපති - වීර ගොවි සංවිධානය
28. ඒ.එම්. සුදුසිංහ මයා - සභාපති - ථේරපුත්ත ගොවි සංවිධානය
29. ශෂී එදිරිසූරිය මයා - ලේකම් - සුභද්‍ර ගොවි සංවිධානය
30. ජේ.ඒ.ඩී. පද්මලාල් මයා - සභාපති - නීල ගොවි සංවිධානය
31. පී.ජී. තරංග මයා - සභාපති - පැරකුම් ගොවි සංවිධානය
32. එස්.පී.සුබසිලි මිය - සභාපති - සේනානායක ගොවි සංවිධානය
33. ඩී.නානායක්කාර මයා - ලේකම් - මහානාග ගොවි සංවිධානය
34. ඩී.එම්.රත්නපාල මයා - සභාපති - වලව ගොවි සංවිධානය
35. ඒ.ආර්.එම්.මර්සුක් මයා - භාණ්ඩාගාරික - අල්-අක්බර් ගොවි සංවිධානය
36. ඒ.ටී.සිරාජුදීන් මයා - ලේකම් - අල්-අක්බර් ගොවි සංවිධානය
37. ඩී.ඩබ්.මංජු රෙපිනෝල්ඩ් මයා - භාණ්ඩාගාරික - දිමුතු ගොවි සංවිධානය
38. එම්.එම්. මහින්ද මයා - සභාපති - දිමුතු ගොවි සංවිධානය
39. යූ. පී සිරිසේන මයා - ලේකම් - පුබුදු ගොවි සංවිධානය

න්‍යාය පත්‍රානුකූලව පළමුව ආගම සිහිකිරීමෙන් පසු නේවාසික ව්‍යාපෘති කළමනාකරු කේ.කේ. ඉන්ද්‍රානි මහත්මිය විසින් පැමිණ සිටි පිරිස පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ ගරු ලේකම් ඒ.පී විමලදාස මහතා විසින් පසුගිය ව්‍යාපාර කළමනාකරණ කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කල අතර වාර්තාවේ සංශෝධන කිසිවක් නොවූ බැවින් වාර්තාව එකමුතු ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරිකතුමාගේ සහ ඉසුරු ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරිකතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

පසු ගිය මාසයේ වී අස්වනු නෙළීම් කටයුතු සිදු වූ බැවින් බොහෝ ගොවි සංවිධානවල කාරක සභා රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ බව දන්වා සිටි අතර පසුගිය මාසයේ කාරක සභා පැවැත්වීම්, මුදල් සාරාංශ ලැබීම් පහත පරිදි ඉදිරිපත් කරන ලදි.

**කාරක සභා පැවැත්වීම හා මුදල් සාරාංශ ලැබීම් - සැප්තැම්බර් මාසය**

| අ/ අ | ගොවි සංවිධානයේ නම | 2017 වසර සඳහා නිලවරණ පැවැත්වීම | මහා සභා රැස්වීම් පැවැත්වීම | කාරක සභා රැස්වීම් පැවැත්වීම | මුදල් සාරාංශය ලැබීම | විගණනය | ව්‍යාපාර කමිටුවට පැමිණීම |
|---|---|---|---|---|---|---|---|
| 01. | මහානාග | - | - | x | √ | - | √ |
| 02. | පැරකුම් | - | - | √ | √ | - | √ |
| 03. | ගජබා | - | - | √ | √ | - | √ |
| 04. | එක්සත් | - | - | x | √ | - | X |
| 05. | නීලසේනාපති | - | - | √ | √ | - | X |
| 06. | විජය | - | - | x | √ | - | √ |
| 07. | සුභද්‍ර | - | - | √ | √ | - | √ |
| 08. | සරුකෙත | - | - | x | √ | - | √ |
| 09. | මහසෙන් | - | - | √ | √ | - | √ |
| 10. | අල් අක්බර් | - | - | x | √ | - | √ |
| 11. | දිමුතු | - | - | x | √ | - | √ |
| 12. | එකමුතු | - | - | √ | √ | - | √ |
| 13. | ථේරපුත්ත | - | - | x | √ | - | √ |
| 14. | රුහුණු | - | - | x | √ | - | √ |
| 15. | පුබුදු | - | - | √ | √ | - | √ |
| 16. | වීර | - | - | x | √ | - | √ |
| 17. | නීල | - | - | √ | √ | - | √ |
| 18. | සේනානායක | - | - | √ | √ | - | √ |
| 19. | ඉසුරු | - | - | x | √ | - | √ |
| 20. | සමගි | - | - | x | √ | - | √ |
| 21. | ගාමිණී | - | - | √ | √ | - | √ |
| 22. | කාවන්තිස්ස | - | - | √ | √ | - | √ |
| 23. | ගෝඨාභය | - | - | x | √ | - | X |
| 24. | වලව | - | - | √ | √ | -- | √ |
| 25. | ප්‍රගති | - | - | √ | √ | - | √ |
| එකතුව | | - | - | 13 | 25 | - | 22 |

වාරිමාර්ග ගැටළු විසඳීමේ ප්‍රගතිය

| අ/ අ | ඉදිරිපත් කල අය | ගැටළුව | තීරණය | වගකීම | ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 01 | පැරකුම් ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරිකතුමා | ප්‍රධාන ඇළේ කි.මී. තුනක් පමණ කැලේ වැවීම නිසා එහි ගමන් කිරීම අපහසුය. | සොයා බලා කටයුතු කිරීම | වා.දෙ. ගො.ස. | ඉටු වී නැත. මෙහෙයුම් නඩත්තු පෙබරවාරි වනවිට සිදු කිරීමට ගිවිසුම් සකස් කර ඇත. |
| 02 | සරුකෙත ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා | SRB ඇළේ මුර ජලය ලබා දීමේ දී ඉඩම් යට වන බැවින් ඉඩම් පිහිටා ඇති පැත්තෙන් පැති බැම්මක් සකස් කර දෙන ලෙස ඉල්ලා සිටියි. | සොයා බලා අවශ්‍ය සුදුසු පියවර ගන්නා බව | වා.දෙ. ගො.ස. | ස්ථානීය පරීක්ෂණය සිදු කර ඇත. පැති බැම්ම සහ ගේට්ටුව ඉදි කිරීමට කැමති බවට ප්‍රදේශවාසීන්ගෙන් අත්සන් කරන ලද ලිපියක් ලබා ගැනීමට උපදෙස් ලබා දුනි. |
| 03 | පැරකුම් ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරිකතුමා | පැරකුම් ගොවි සංවිධානයට අයත් CPO ඇළ කණ්ඩිය උස් කිරීම සිදු කර දෙන ලෙස ඉල්ලීම | ඇස්තමේන්තු සකස් කර ඇත. | වා.දෙ. ගො.ස. | ඉටු වී නැත. |
| 04 | වීර ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා | ඇළේ නඩත්තු කටයුතු සඳහා JCB යන්ත්‍රය ලබා දෙන ලෙස ඉල්ලීම | කාර්යාලයට පැමිණ දිනයක් ලබා ගන්නා ලෙස වාරි.ඉංජි. තුමා දන්වා සිටි. | වා.දෙ. ගො.ස. | ඉටු වී නැත. JCB යන්ත්‍රය කැඩී ඇත. දින තුනක් ඇතුලත ලබා දෙන බව. |
| 05 | දිමුතු ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරිකතුමා | ලෝලු ගහ ඇනිකට් එක ළඟ ඇළණ්ඩිය කපා ජලය ලබා ගන්නා බැවින් ඒ සඳහා U - ආස්තරණයක් ඉදිකර දෙන ලෙස ඉල්ලා සිටි. | | වා.දෙ. ගො.ස. | ඉංජිනේරු සහකාර මහතාට දැනුම් දෙන බව පවසා සිටි. ඉටු වී නැත. |
| 06 | සරුකෙත ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා | සරුකෙත ගොවි සංවිධානයට අයත් LB 2 ඇළේ පයිප්ප දෙකක් වසා ඇත.එය විවෘතකර දෙන ලෙස ඉල්ලීම | මේ පිළිබඳව ලිඛිතව ඉදිරිපත් කර ලෙස වාරි.ඉංජි. තුමා දන්වා සිටි. | | |
| 07 | ගජබා ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා | රුහුණු ජල ව්‍යාපෘතියේ පෝෂිතාගාරය ශුද්ධ කිරීම සඳහා පාවිච්චියට ගනු ලබන ජලය කඩවර වැවට එක්වන බව පැවසීය. | | | ලිඛිතව ජල සම්පාදන මණ්ඩලයට ලබා දීමට කටයුතු කරන ලෙස දන්වා සිටි. |
| 08 | සරුකෙත ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා | තම බල ප්‍රදේශයේ වැඩ කටයුතු කිහිපයක් කර ගැනීම සඳහා මෝටර්ගේඩරයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටි. | ප්‍රාදේශිය කෘෂිකර්ම කමිටුවට ඉදිරිපත් කරන ලෙස වාරි.ඉංජි. තුමා දන්වා සිටි. | | ඉටු වී නැත. ඒකාබද්ධ ගොවි සංවිධානයෙන් අධ්‍යක්ෂ ජනරාල්ට ලිපියකින් ඉල්ලීම් කරන ලෙස දන්වා සිටි. |

ජල තත්ත්වය

ජලයාලේ උස - අඩි 13 අඟල් 9

ජලධාරිතාව - අක්කර අඩි 15695

මෙම මස 04 වන දින මහවැලි ජල පාලන කමිටුව පැවති අතර එහිදී වලව දකුණ ඉවුර සඳහා නොවැම්බර් මස 20 වන දිනත් වම් ඉවුර සඳහා නොවැම්බර් මස 15 වල දිනත් ජලය නිකුත් කිරීමට තීරණය විය.එනමුත් සාකච්ඡා කර පසුව එම යෝජනා සංශෝධන කරගත් බව ඉංජිනේරු මහතා පවසා සිටියේය.
උඩවලව ජලාශයේ ද ජල මට්ටම අක්කර අඩි 20000 වඩා අඩු මට්ටමක පවතින බවත් 2017 යල කන්නය අවසන් වන විට රිදියගම වැවේ ජල ධාරිතාවය අක්කර අඩි 9000 දක්වා අඩු වූ අතර මෙම කන්නය ආරම්භයේ දී වර්ෂාවත් සමඟ ජල ධාරිතාවට අක්කර අඩි 18000 දක්වා වැඩි වේ යැයි අපේක්ෂා කරන බවත් මෙවර 2017/2018 මහ කන්නය අවිනිශ්චිත වගා කන්නයක් විය හැකි බවත් වැඩිදුරටත් අදහස් දක්වමින් වාරිමාර්ග ඉංජිනේරු මහතා පවසා සිටියේය.

වාරිමාර්ග ගැටළු

| අ/අ | ඉදිරිපත් කල අය | ගැටළුව | තීරණය | වගකීම | ක්‍රියාත්මක වීමට ගත වන කාලය |
|---|---|---|---|---|---|
| 01 | කාවන්තිස්ස ගොවි සංවිධානයේ ගරු ලේකම්තුමා | ගොවි සංවිධාන වලින් ඉදිරිපත් කර ඇති වැඩ යෝජනා සඳහා මුදල් වෙන් වී නොමැති හෙයින් ගොවි සංවිධාන පවත්වාගෙන යාමේ දී අසීරුතාවයන්ට මුහුණ දීම. | සුහද ගොවි සංවිධානයේ ගරු ලේකම්තුමා හා වාරිමාර්ග කලාප අධ්‍යක්ෂතුමා අතර සිදු වූ දුරකථන සාකච්ඡා වෙන් පසු මෙම මස 12 වන දින ලියන්ගස්තොට - දකුණු ඉවුර ඇනිකට් එක ළඟදී පෙ.ව.10.00 ට ගොවි නායකයන් වාරිමාර්ග කලාප අධ්‍යක්ෂතුමා හමුවීමට තීරණය විය. | වා.දෙ.<br>ගො.සං. | |
| 02 | පැරකුම් ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා | කොග්ගලු ආර බස්නාව ශුද්ධ කර දෙන ලෙස ඉල්ලා සිටී.<br>ශුද්ධ කිරීම ගඟ ළඟ සිට ඉහළට කරන ලෙස ද ඉල්ලා සිටී. | කොග්ගලු ආර බස්නාව සම්පූර්ණයෙන් ශුද්ධ කිරීමටත් බස්නාවේ දෙපැත්තේ පැතිබැම් ඉදිකිරීමට ඇති බවත් වාරි.ඉංජි. තුමා දන්වා සිටී. | වා.දෙ.<br>ගො.සං. | |
| 03 | ගජබා ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා | රිදියගම වැවේ රක්ෂිත බිම් සලකුණු කිරීම තාවකාලිකව අත්හිටුවීම පිළිබඳව පැහැදිලි කරන ලෙස ඉල්ලීම. | අනවසර පදිංචිකරුවන්ගේ විරුද්ධත්වය මත රිදියගම වැවේ වැව් රක්ෂිතය වෙන් කිරීම තාවකාලිකව නතර කිරීමට සිදු වී ඇති බව ඒකාබද්ධ ලේකම්තුමා පවසා සිටී. | වා.දෙ.<br>ගො.ස. | |
| 04 | ගජබා ගොවි සංවිධානයේ ගරු ලේකම්තුමා | ගොඩ ගොවිතැන් කරන ගොවීන්ගේ ප්‍රයෝජනය සඳහා එක් දිනක් හෝ පැය කිහිපයක් ජලය ලබා දෙන ලෙස ඉල්ලා සිටී. | ඔක්තෝම්බර් මස 10 වන දින ප.ව.3.00 සිට ප.ව.6.00 දක්වා ජලය ලබා දීමට තීරණය විය. | වා.දෙ.<br>ගො.ස. | අද දිනයේ දීම |

නේවාසි ව්‍යාපෘති කලමනාකාරතුමිය විසින් 2017 යල කන්නයේ කාබනික පොහොර භාවිතා කර වී වගා කළ ගොවි මහතුන්ගේ අදහස් විමසා සිටියාය.එම අදහස් පහත පරිදි වේ.

| අ/ අ | ඉදිරිපත් කල අය | ඉදිරිපත් කල අදහස් |
|---|---|---|
| 01 | අල්-අක්බර් ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා | අක්කර 1/2 ක් පමණ කිරි සම්බා වගා කළ බවත් ඒ සඳහා කාබනික පොහොර හා පළතුරු ටොනික් භාවිතා කළ බවත් අස්වැන්න අක්කර 1/2 කින් වී 1900 Kg ලබා ගැනීමට හැකි වූ බවත් පැවසීය |
| 02 | පුබුදු ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරිකතුමිය | කාබනික පොහොර යොදා අල්ලි දහයක් වී වගා කළ බවත් TSP පොහොර නොයෙදූ බවත් අල්ලි දහයෙන් වී 4800 Kg ක් ලබා ගැනීමට හැකි වූ බවත් පැවසීය. |
| 03 | ප්‍රගති ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා | අක්කර 1/2 ක් කාබනික පොහොර යොදා වී වගා කළ අතර අස්වැන්න 2000 Kg ක් ලබා ගැනීමට හැකි විය.පෙර වගා කන්න වල දීට වඩා වී වල බර ප්‍රමාණය ද වැඩි බව පැවසීය. |
| 04 | දිමුතු ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික තුමා | අක්කර 3/4 ක් කාබනික පොහොර යොදා වී වගා කළ අතර එයින් හොඳ අස්වැන්නක් ලැබුණ බව. |

කාබනික පොහොර සෑදීමේ දී වාරිමාර්ග ඉංජිනේරුතුමා ලබා දුන් සහයෝගය නේවාසික ව්‍යාපෘති කළමනාකාරතුමිය විසින් අගය කර සිටියාය. සෑම ගොවි සංවිධාන බල ප්‍රදේශයකම කාබනික පොහොර ඒකක පිහිටුවීමට කටයුතු කරන ලෙස ද එතුමිය විසින් වැඩිදුරටත් දන්වා සිටින ලදී.

### ලිපි ඉදිරිපත් කිරීම - කේ.කේ.ඉන්ද්‍රානි මිය - නේ.ව්‍යා.කළමනාකරු

01. අංක 10/3/2/9 හා 2017.10.06 දිනැති ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමය නැමති ලිපිය

එක් පවුලක් සඳහා පළතුරු පැළ එකක් බහුවාර්ෂික පැළයක් (කොස්,දෙල්,පොල්) බැගින් ගොවි සංවිධාන අරමුදලින් හෝ ලබා ගෙන ගොවි මහත්වරුන්ට ලබා දෙන ලෙස දන්වා සිටියාය.

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - එන්.පී.ඒ ගුණවර්ධන මයා - ස්ථානභාර කෘෂිකර්ම උපදේශක - අ/තොට

2017/2018 මහ කන්නයේ වගා කටයුතු රිදියගම ජලාශයෙන් ජලය ලබා නොගෙන වැසි දියෙන් ආරම්භ කිරීමට කටයුතු කිරීම වැදගත් වේ. පිදුරු පිළිස්සීම සිදු නොකරන ලෙසත්,පිදුරු ඉක්මනින් දිරාපත් වීම සඳහා පොදු වැස්ස පවතින විට අක්කරයකට යූරියා 10 Kg ක් ඉසීම සිදු කළ හැකි බවත් සඳහන් කළේය. තවදුරටත් අදහස් දක්වමින් කෘෂිකර්ම උපදේශක මහතා ප්‍රකාශකර සිටියේ මහ කන්නයේදී කොප්‍රමයිටා හානිය අවම බවත් මාර්තු 15 වන විට අස්වැන්න නෙලා ගැනීමට හැකි වන පරිදි වගා කටයුතු ආරම්භ කිරීම වඩා සුදුසු බවත්ය.

### ගොවිජන සේවා දෙපාර්තමේන්තුව - ඒ.ඩී ක්‍රිශාන්ති මිය - ගොවිජන සේවා සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී - අ/තොට

පොහොර සහනාධාර ලබා දීමේ දී ඇළවේලි ශුද්ධ නොකල,සාමාජික මුදල් ගෙවීම පැහැර හැර ඇති ගොවි මහතුන්ට සහ පිදුරු පිළිස්සා ඇති අයට පොහොර සහනාධාර සඳහා නිර්දේශ නොකරන බව ගොවි ජන සේවා නිලධාරිතුමිය දන්වා සිටියාය. වැඩිදුරටත් අදහස් දක්වමින් එතුමිය ප්‍රකාශ කර සිටියේ අතිරේක බෝග වගා කරන ගොවීන්ටද හෙක්ටයාර් එකකට රුපියල් දහදහසක් ලබා දෙන බවත් කාන්තා ගොවි සංවිධාන වලට මෙම මස 13 වන දින බීජ පැකට් ලබා දීමට තීරණය කර ඇති බවත්ය.

### 2017/2018 මහ පෙර කන්න රැස්වීම

ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ වැඩකටයුතු නිමවීමෙන් අනතුරුව 2017/2018 මහ පෙර කන්න රැස්වීමේ තීරණ පිළිබඳ සාකච්ඡා කරන ලදී. ඒ අනුව එහිදී පහත සඳහන් තීරණ සභාවට ඉදිරිපත් කරන ලදී. 1994 අංක 13 දරණ වාරිමාර්ග සංශෝධිත ආඥා පනතේ 5 අ (5) උප වගන්තියට අනුව

- වගා රැස්වීම සඳහා යෝජිත දිනය :- 2017/10/16 ප.ව 2.30
- වගා කරන බෝග වර්ගය :- මාස 3 මාස 3 1/2 වී
- වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය :- හෙක්ටයාර් 3200
- වගා කිරීමට යෝජිත ප්‍රදේශ :- රිදියගම මුළු ව්‍යාපාර බල ප්‍රදේශය
- ගොවීන් විසින් ඇලවල් වල නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය :- 2017.10.25
- ගොවීන් විසින් නියමිත වෙලාවට නඩත්තු නොකරනු ලබන ඇලවල් ගොවි සංවිධාන විසින් නඩත්තු කර අවසන් කළ යුතු දිනය :- 2017.10.28
- ගොවි සංවිධාන හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන ඇල සහ බෙදුම් ඇලවල්, කෙත් ඇලවල් සහ දිය බස්නා ඇලවල්වල නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය :- 2017.10.25
- මුල් වරට ජලය රිදියගම ජලාශයෙන් නිකුත් කිරීමට යෝජිත දිනය :- 2017.11.01
- බිම් සැකසීම ආරම්භ කළ යුතු දිනය :- 2017.11.01
- වපුරා අවසන් කළ යුතු දිනය :- 2017.11.25
- මුර ජල ක්‍රමය ආරම්භ කළයුතු දිනය :- 2017.12.25
- අවසන් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය :- 2017.02.25
- ට්‍රැක්ටර් හා ගවයින් යායෙන් ඉවත් කළ යුතු දිනය :- 2017.11.15
- වගා රක්ෂණය කර අවසන් කළ යුතු දිනය :- 2017.11.25
- අස්වනු නෙලා අවසන් කළ යුතු දිනය :- 2018.03.10

**2017/18 මහ කන්නය සඳහා පොහොර සහනාධාර ලබා දීමේ චක්‍රලේඛ අනුව පහත තීරණ ගන්නා ලදී.**

- නියමිත දිනට පෙර ඇලවේලි ශුද්ධ නොකරන ගොවීන්ගේ පොහොර සහනාධාර අයදුම්පත්‍ර ගොවි සංවිධානය විසින් නිර්දේශ නොකිරීම.
- 2017 යල කන්නයේ කුඹුරේ පිදුරු පුළුස්සා ඇති අයට පොහොර සහනාධාරය නිර්දේශ නොකිරීමට ගොවි සංවිධාන විසින් තීරණය කරන ලදී.
- යම් ගොවි මහතෙකු විසින් පිදුරු පුළුස්සා ඇති නම් එම කුඹුරට කාබනික පොහොර අනිවාර්යයෙන්ම යෙදිය යුතු අතර ඒ බව කෘෂිකර්ම උපදේශක මහතා/කෘෂිකර්ම පර්යේෂණ නිලධාරි හා ගොවි සංවිධානය විසින් නිර්දේශ කළ යුතුය.

**1994 අංක 13 දරණ (සංශෝධිත) වාරිමාර්ග ආඥා පනත 11 උප වගන්තිය අනුව ඉදිරි කන්නයේ කටයුතු ක්‍රියාත්මක නිති රීති**

| | | |
|---|---|---|
| I. | ගවයින් යායට ඇතුළු නොකිරීමට තීරණය විය. | |
| II. | අයාලේ යන ගවයින් බැඳීමේ දඩය | එක් ගවයෙකුට දිනකට රු. 1500/- |
| III. | ඇල වේලි ශුද්ධ නොකිරීමේ දඩය | - මීටරයකට රු. 1250/- |
| IV. | වැට නොබැඳීමේ දඩය | - මීටරයට රු. 250/- |
| V. | නියර සහ මායිම් නියර නොබැඳීමේ දඩය | - මීටරයට රු. 500/- |
| VI. | පිදුරු පිලිස්සීමේ දඩය | - අක්කරයට රු. 5000/- |
| VII. | වාරිමාර්ග රක්ෂිත වලට තෙල් ඉසීමේ දඩය | - වර්ග මීටරයට රු. 1000/- |
| VIII. | වාරි ජලයට අපද්‍රව්‍ය දැමීමේ දඩය | රු. 5000/- |
| IX. | ඇල වේලි වල වගා කරන අයට දඩය | - වර්ග මීටරයට රු. 1000/- |
| X. | රක්ෂිත ගල් ඉවත් කිරීමේ දඩය | - රු.100000 /- |
| XI. | නියමිත දිනෙන් පසු ජලය මුදා නොහැරීම තීරණය විය. | |

වැට බඳින ප්‍රදේශ :- අරවනමුල්ල, කුඩාබෝලාන , කරගස්ආර සියඹලාගස්විල , ගල්ලවිල යාය, ගොඩකොග්ගල්ල යාය ,හබරත්තවල යාය, දැහැම්පුර යාය ,පාසැල් ඇල යාය, බැරගම, බැරගම නැගෙනහිර යාය, පුංචි මදව්ව, මහ ආර, බැරගම්විල යාය, ඉසුරු ගොවි සංවිධාන බල ප්‍රදේශය හකුරන්මුල්ල යාය, පංගු ලැයිස්තුව අනුව ක්‍රියාත්මක වේ.

ඉහත තීරණ සුහද ගොවි සංවිධානයේ ගරු ලේකම් ශෂී එදිරිසූරිය මයාගේ සහ එකමුතු ගොවි සංවිධානයේ ගරු ලේකම් හැන්ඩ් අබේධීර මයාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

ලේකම් තුමාගේ ස්තුති කථාවෙන් පසු එදිනට නියමිත ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීමේ හා 2017/2018 මහ පෙර කන්න රැස්වීමේ වැඩ කටයුතු නිමා විය.

ලේකම්
ව්‍යාපාර කළමනාකරණ කමිටුව
රිදියගම ව්‍යාපාරය

කේ.කේ.ඉන්ද්‍රානි
නේවාසික ව්‍යාපෘති කළමණාකරු
රිදියගම ව්‍යාපාරය

[illegible]. කේ. ඉන්ද්‍රානි
නේවාසික ව්‍යාපාර කළමනාකරු
රිදියගම ව්‍යාපාරය,
[illegible] රිදියගම බෝධ්‍යාණ

පිටපත්:-

| | | | |
|---|---|---|---|
| 01. | අධ්‍යක්ෂ වාරිමාර්ග කළමනාකරණ අංශය - කොළඹ | - | කා:දැ:ස |
| 02. | ප්‍රාදේශීය ලේකම් - අම්බලන්තොට/ හම්බන්තොට | - | කා:දැ:ස |
| 03. | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අ.ප.) - හම්බන්තොට | - | කා:දැ:ස |
| 04. | අධ්‍යක්ෂ - කෘෂිරක්ෂණ මණ්ඩලය | - | කා:දැ:ස |
| 05. | වාරිමාර්ග ඉංජිනේරු - අම්බලන්තොට | - | කා:දැ:ස |
| 06. | ගොවිජන සේවා ප්‍රාදේශිය නිලධාරි - අම්බලන්තොට | - | කා:දැ:ස |
| 07. | මූලස්ථාන කෘෂිකර්ම උපදේශක - අම්බලන්තොට | - | කා:දැ:ස |